COVID-19 එන්නත

# සත්‍ය කරුණු ලබා ගන්න.

## COVID-19 සහ ඉන්ෆ්ලුවෙන්සා එන්නත

COVID-19 යනු දරුණු රෝගයකි. ඉන්ෆ්ලුවෙන්සා රෝගය වැළඳීම ඕනෑම අවස්ථාවක අනතුරුදායක විය හැකිය, නමුත් මේ අවුරුද්දේ එය වඩාත්ම අනතුරු දායක වන්නේ:

- ✓ එකම අවස්ථාවේ ඉන්ෆ්ලුවෙන්සා සහ COVID-19 යන රෝග දෙකම වැළඳෙන පුද්ගලයින් සංකූලතාවලට සහ මරණයට ලක්වීමට වැඩි ඉඩකඩක් පවතී.
- ✓ ඔබ ඉන්ෆ්ලුවෙන්සා හේතුවෙන් දැඩි ලෙස රෝගී වුවහොත් වෛද්‍ය උපකාර ලබා ගැනීම අපහසු විය හැකිය. COVID-19 හේතුවෙන් රෝගී වූ බොහෝ පුද්ගලයින් ප්‍රමාණයක් සිටින බැවින් සාමාන්‍ය පරිදි ඉන්ෆ්ලුවන්සා රෝගය හේතුවෙන් රෝගී වූ අයට ප්‍රතිකාර කිරීමට වෛද්‍යවරුන්ට සහ රෝහල්වලට නොහැකි වනු ඇත.



## නිශ්චිතවම දැන ගැනීමට පරීක්ෂා කරගන්න

COVID-19 සහ ඉන්ෆ්ලුවෙන්සා (ෆ්ලූ) යන රෝගවල රෝගලක්ෂණ ඉතාමත් එක සමානය:

- උණ
- කැස්ස
- හුස්ම ගැනීමේ අපහසුතාව
- අධික වෙහෙස (මහන්සිය)
- උගුරේ වේදනාව
- බුරුල් හෝ බර වූ නාසය
- මාංශ පේශී වේදනාව හෝ ඇඟපත රිදීම
- හිසරදය
- වමනය සහ පාචනය

**වැළඳී ඇත්තේ COVID-19 ද ඉන්ෆ්ලුවෙන්සා ද යන්න නිශ්චිතව දැනගත හැකි එකම ක්‍රමය වන්නේ පරීක්ෂා කරවා ගැනීමය.**



## වැඩි ආරක්ෂාවක් සඳහා COVID-19 සහ ඉන්ෆ්ලුවෙන්සා යන රෝග දෙක සඳහාම එන්නත් ලබා ගන්න

- COVID-19 සහ ඉන්ෆ්ලුවෙන්සා එන්නත් දෙකෙන්ම ඔබ, ඔබේ පවුල, සහ ඔබේ ප්‍රජාව ආරක්ෂා කරයි.
- එන්නත් දෙකෙන්ම ඔබව අසනීප වීමටත් අන් අය වෙත රෝගය බෝ වීමටත් ඇති ඉඩකඩ අඩු කරයි. ඔබට රෝගය වැළඳුනහොත් ඔබ භයානක ලෙස රෝගී වීමද එන්නත් මගින් වැළකේ.

NRC-RIM
National Resource Center for Refugees, Immigrants, and Migrants

5 Apr 2022

වැඩි විස්තර සඳහා: cdc.gov/coronavirus



# ඉන්ෆ්ලුවෙන්සා සහ COVID-19 එන්නත් දෙකම ආරක්ෂිතය.

- COVID-19 සහ ඉන්ෆ්ලුවෙන්සා එන්නත් දෙකම එකවර ලබා ගැනීම ආරක්ෂිත සහ ඵලදායී වේ.
- COVID-19එන්නතලබාගැනීමසඳහාවන වයස සම්පූර්ණ කර නොමැති ළමුන්ටඉන්ෆ්ලුවෙන්සාඑන්නත ලබා ගත හැකිය.

## ඉන්ෆ්ලුවෙන්සාසහCOVID-19රෝගවලින්ඔබවසහඔබේ ප්‍රජාව ආරක්ෂා කර ගන්න

- ඔබටරෝගීබවක්දැනෙන නැමඅවස්ථාවකසේවයට, පාසලට හෝ සමාජීය කටයුතුවලට සහභාගී නොවී නිවසටවී සිටින්න.
- COVID-19 සහ ඉන්ෆ්ලුවෙන්සා එන්නත්දෙකමලබා ගන්න
- ඔබ එන්නත් ලබා ගෙන සිටින්නේ නමුත් මුඛ ආවරණ පළඳින්න.
- සමාජ දුරස්තභාවය පවත්වා ගන්න.
- දෑත් සහ මතුපිටවල් නිතර සෝදන්න.

NRC-RIM
National Resource Center for Refugees, Immigrants, and Migrants



වැඩි විස්තර සඳහා: cdc.gov/coronavirus